බඳවා ගැනීමේ පටිපාටිය

සේවා ගණය :- කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ 2

වැටුප් කේතය :- **MN-1**

තනතුරු :- ධීවර බලපත්‍ර නිලධාරි

ධීවර පරීක්ෂක

ධීවර සමාජ සංවර්ධන සහකාර

රා.සේ.කො. අනුමත කළ දිනය :- 2012.05.22

Scanned with CamScanner

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි

කළමනාකරණ සහකාර තාක්ෂණ සේවක -ඛණ්ඩ 2 නිලධර ගණය සඳහා වන

බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : ධීවර හා ජලජ සම්පත්	යොමු අංකය :ධීජදෙ/ආ02/02/ඛ.ප.(MN 1) දිනය : 2012.05.16
1.2 අමාත්‍යාංශය : ධීවර හා ජලජ සම්පත් සංවර්ධන	යොමු අංකය : 1/5/1/7/ධී.දෙ/ඛ.ප./MN1 දිනය : 2012.05.24
1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම	යොමු අංකය :DMS/C/3/36/01 දිනය : 2010.11.08 / 2011.05.06
1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :	යොමු අංකය :EST-3/RECRU/03/4879 දිනය : 2012.01.23
1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :	යොමු අංකය: NSCC/5/36/1/SR-1 දිනය :2011.10.19
1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය	යොමු අංකය:PSC/EST/3/1/36/2012 දිනය :2012.05.24

02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවරන ලද ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්.

03. නිලධර ගණය පිළිබඳ විස්තර

3.1 නිලධර ගණය : කළමනාකරණ සහකාර තාක්ෂණ සේවක - ඛණ්ඩ 2

3.2 ශ්‍රේණි : I,II,III

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

ආයතනයන්හි විධායක හා පරිපාලන යන මට්ටම්වල නියුතු වුවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූද, ඒකල ස්වරූපයේ වූද (Single Functional) කාර්යයන් මෙම නිලධර ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම නිලධර ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

04. තනතුරේ ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 1-2006 A

5.2 වැටුප් පරිමාණය : රු.13120 - 10 x 145 -11 x170 - 10 x 240 -10 x 320-22040/-

Scanned with CamScanner

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

ශ්‍රේණිය	වැටුප් පියවර	වැටුප් තලය (රු.)
111	පියවර 01	රු. 13,120.00
11	පියවර 12	රු. 14,740.00
1	පියවර 23	රු. 16,680.00

06. නිලධර ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්.

අනුමත තනතුරු නාම	අනුමත නිලධර සංඛ්‍යාව	කාර්යයන්
01.ධීවර බලපත්‍ර නිලධාරි	01	1. ප්‍රධාන කාර්යාලයේ ධීවර මෙහෙයුම් බලපත්‍ර සඳහා වන පරිගණක දත්ත පද්ධතිය පවත්වාගෙන යාම සඳහා සහායවීම. එමෙන්ම ක්ෂේත්‍ර කාර්යාලයන්හි පරිගණක දත්ත පද්ධති පවත්වාගෙන යාම සඳහා සහායවීම සහ වාර්තා සකස් කිරීම. 2. මෙහෙයුම් බලපත්‍ර ලබාගැනීම සඳහා ධීවර ප්‍රජාවගේ අනුකූලතාවය වැඩිදියුණු කිරීම උදෙසා දිස්ත්‍රික් ධීවර කාර්යාල වලට සහායවීම. 3. මෙහෙයුම් බලපත්‍ර ලබාගැනීම හා සම්බන්ධ කටයුතු වලදී ප්‍රධාන කාර්යාලය හා ක්ෂේත්‍ර කාර්යාල සම්බන්ධීකරණය කිරීම. 4. අධ්‍යාපන වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා සහායවීම. 5. ධීවර කළමනාකරණ ක්‍රියාවලිය සඳහා බලපත්‍ර සමෝධානය කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට සහායවීම. 6. අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි.
02.ධීවර පරීක්ෂක	178	1. ධීවර හා ජලජ සම්පත් පනත හා අදාල නීති රීති ක්‍රියාත්මක කිරීම. 2. ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමට ක්‍රියාත්මක වන වැඩසටහන් වලට සහය වීම. 3. සමුපකාර ආඥා පනත යටතේ ධීවර සමුපකාර සමිති පිහිටුවීම. 4. ධීවර සුභසාධන සේවා සැලසීම, . 5. සංඛ්‍යා ලේඛණ රැස්කිරීම හා අදාල ආයතනයන්ට යොමු කිරීම. 6. ආදායම් රැස්කිරීම හා බැංකුගත කිරීම. 7. සහනාධාර යෝජනා හා ව්‍යාපෘති කටයුතු සම්බන්ධව අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම. 8. ධීවර සම්මේලනයට අදාලව ධීවර සමිති පිහිටුවීම, අධාර ලබාදීම හා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම. 9. අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි.

Scanned with CamScanner

03. ධීවර සමාජ සංවර්ධන සහකාර	24	1. ධීවර සමාජ සුභ සාධන කටයුතු,ධීවර සමාජ සංවර්ධන ග්‍රාමීය සංවිධාන පිහිටුවීම හා එම සංවිධාන නිසි ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් දීම. 2. ධීවර ප්‍රජාව සඳහා අවශ්‍ය වන පරිදි මනෝවිද්‍යාත්මක උපදේශන සේවා සැපයීම හා වරින් වර පසුවිපරම් කිරීම. 3. යටිතල පහසුකම් සැපයීම පිළිබඳව ප්‍රගති පරීක්ෂා කිරීම. 4. දිස්ත්‍රික් සංවිධාන කටයුතු පවත්වාගෙන යාම 5. දියවර ගම්මාන වල ජනතා සමාගම් සම්බන්ධීකරණය කිරීම. 6. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා පෙර පාසැල් කටයුතු අධීක්ෂණය කිරීම හා ඒවාට අවශ්‍ය උපකරණ ලබාදීම. 7. ධීවර සමාජ සංවර්ධන ග්‍රාමීය සංවිධානවල තොරතුරු, ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ ප්‍රගතිය, ඉලක්ක පෙන්වන වගු සටහන් පවත්වාගෙන යාම, දියවර ගම්මාන සම්බන්ධ සියළු කටයුතු කිරීම. 8. විසිරි නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල සියළු කටයුතු කිරීම. 9. අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරී.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ධීවර බලපත්‍ර නිලධාරි	01
ධීවර පරීක්ෂක	178
ධීවර සමාජ සංවර්ධන සහකාර	24

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස්කිරීමේ කාර්යය සඳහා III,II හා I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

සටහන :

අනුමත ධීවර පරීක්ෂක තනතුරු 178 න් තනතුරු 5 ක් දැනට අධි සේවක පදනම මත පත් කර ඇති නිලධාරීන්ට පෞද්ගලික වන අතර ඊට පසුව අහෝසි වීමට යටත් වේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගැනීමේ අනුපාතය

ධාරාව	ප්‍රතිශතය
විවෘත	100%

7.2 විවෘත බඳවා ගැනීම:

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

Scanned with CamScanner

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්

තනතුර	සුදුසුකම
ධීවර පරීක්ෂක	I. සත්ත්ව විද්‍යාව, උද්භිද විද්‍යාව යන විෂයයන් සහිතව අ.පො.ස.(උ.පෙළ)විභාගයෙන් එකවර විෂය 04කින් සමත්ව තිබීම (පැරණි විෂය නිර්දේශය අනුව) හෝ II. ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව අ.පො.ස.(උ.පෙළ) නව නිර්දේශ විභාගයෙන් එකවර විෂ 03කින් සමත්ව සිටීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සහ III. සිංහල භාෂාව / දෙමල භාෂාව, අංක ගණිතය / ශුද්ධ ගණිතය, ඉංග්‍රීසි සහ ජීව විද්‍යාව යන විෂය සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස.(සා.පෙළ) පැරණි නිර්දේශය විභාගයෙන් විෂයයන් 06කින් සම තිබීම හෝ IV. සිංහල භාෂාව / දෙමල භාෂාව, ගණිතය, ඉංග්‍රීසි යන විෂයයන්ට සම්මාන සාමාර්ථ ස අ.පො.ස.(සා.පෙළ) නව / අතුරු නිර්දේශය විභාගයෙන් විෂයයන් 06කින් සමත් වී තිබීම
ධීවර සමාජ සංවර්ධන සහකාර	I. අ.පො.ස. (උ.පෙළ) විෂයයන් 04කින් එකවර සාමාර්ථයක් ලබා තිබීම (පැරණි විෂය නිර්දේශය අ හෝ II. අ.පො.ස.(උ.පෙළ) නව නිර්දේශ විභාගයෙන් එකවර විෂයයන් 03කින් සමත්ව සිටීම (සාමාන්‍ය පරීක්ෂණය හැර) සහ III. සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය / අංක ගණිතය, ඉංග්‍රීසි යන විෂයයන්ට සම්මාන සාම සහිතව අ.පො.ස. (සා.පෙළ) විෂයයන් 06කින් සමත්වී තිබීම
ධීවර බලපත්‍ර නිලධාරී	I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. සහ II. සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, ඉංග්‍රීසි සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්ව තිබීම.

සටහන :

උතුරු නැගෙනහිර පළාත් සඳහා දෙමළ මාධ්‍යයෙන් රාජකාරි කල හැකි ධීවර පරීක්ෂකයින් 25 දෙනෙකු අවශ්‍ය වි ප්‍රථම වතාවට බඳවා ගැනීමේදී අයදුම්කරුවන් අතුරින් දෙමළ මාධ්‍ය සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් ස නොමැති නම් පමණක් උතුරු නැගෙනහිර පළාත්වල පදිංචි ධීවර විද්‍යාව පිළිබඳ දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝම ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ගෙන් උතුරු නැගෙනහිර පළාත්වල අඛණ්ඩව වසර 10ක් සේවය කිරීමේ පදනම තනතුරු 25 සඳහා බඳවා ගනු ලැබේ.

Scanned with CamScanner

7.2.2.2 වෘත්තිය සුදුසුකම් :

තනතුරුනාමය	වෘත්තිය සුදුසුකම්
ධීවර බලපත්‍ර නිලධාරි	තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා 06 මසකට නොඅඩු පරිගණක පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම.
ධීවර පරීක්ෂක	අදාල නොවේ.
ධීවර සමාජ සංවර්ධන සහකාර	අදාල නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාල ක්ෂේත්‍රයේ ලබා ඇති පලපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් : I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 30 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ධීවර සමාජ සංවර්ධන සහකාර සහ ධීවර පරීක්ෂක තනතුරු සඳහා ලිඛිත විභාගයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ධීවර බලපත්‍ර නිලධාරි තනතුර සඳහා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

තනතුර	විෂයයන්	කාලය	මුළු ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
I. ධීවර සමාජ සංවර්ධන සහකාර II. ධීවර පරීක්ෂක	රචනය හා සාරාංශය	පැය 02	100	40%
	සාමාන්‍ය දැනීම	පැය 01	100	40%
	බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%

Scanned with CamScanner

7.2.4.1.1 පවත්වන බලධාරියා :

ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරා ලබන ආයතනයක් විසින්

7.2.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාල නොවේ.

විෂයයන්	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
-	-	-

7.2.4.2.1 පවත්වන බලධාරියා : අදාළ නොවේ.

හා/හෝ

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබනශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
• **අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**	40	40%
• **අතිරේක වෘත්තිය සුදුසුකම් :**	20	
• **ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය**	15	
• **පළපුරුද්ද :**	20	
• **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව**	05	

7.2.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා :
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලය විසින්

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය- (ලකුණු ලබා දෙනු නොලැබේ)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : ධීවර සමාජ සංවර්ධන සහකාර සහ ධීවර පරීක්ෂක යන තනතුරු වලට අදාල නිලධාරීන් බඳවා ගැනීමේදී මූලික සුදුසුකම් , සහතික සහ මනා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියා :

ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලය විසින්

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ දැන්වීම් පළකිරීම් හෝ වෙබ් අඩවියේ පලකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

Scanned with CamScanner

8.1

කුමන කාර්යක්ෂමතා කඩඉම්ද යනවග	කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද	කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත/වෘත්තීය/සහතික පාඨමාලා/වෙනත්
1 වන කාර්යක්ෂමතා කඩඉම	111 ශ්‍රේණියට පත්වී වසර 03 ක් ගත වීමට පෙර	ලිඛිත
2 වන කාර්යක්ෂමතා කඩඉම	11 ශ්‍රේණියට උසස් වී වසර 03 ක් ගත වීමට පෙර	ලිඛිත
3 වන කාර්යක්ෂමතා කඩඉම	1 ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ගත වීමට පෙර	ලිඛිත

විෂය නිර්දේශය ඇමුණුම් I, II , III යටතේ දැක්වේ.

8.2 පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන

බලධරයන් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

2 වන කාර්යක්ෂමතා කඩඉම : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

3 වන කාර්යක්ෂමතා කඩඉම : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

9.1

භාෂාව	ලබා ගත යුතු ප්‍රවීණතාවය
01 රාජ්‍ය භාෂාව	රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල ලබා ගත යුතුය.
02 අනෙක් රාජ්‍ය භාෂාව	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 7/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

Scanned with CamScanner

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1 111 වන ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ගණයේ 111 ශ්‍රේණියේ අවම වයයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබා ගෙන තිබීම.

VI. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.1.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ගණයේ 111 ශ්‍රේණියේ අවම වයසේ වසර හයක (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ස නියමිත වැටුප් වර්ධක හය (06) ම උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වස හය (06) තුළම සුවිශේෂී කාර්ය සාධන මට්ටමක් පෙන්නුම් කර තිබීම.

IV. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

V. උසස්කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර් කර තිබීම.

VI. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය තුළදී ලබා ගෙන තිබීම.

10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය :

පත්කිරීම් බලධාරියා විසින් අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ශ්‍රේ අභියෝගතා පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉන් සමත්වන්නන් විසින් පත්කිරීම් බලධාරියා ණ නියමිත ආකෘති පත්‍රය මගින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධාරියා විසින් සුදු පරීක්ෂා කර බැලීමෙන් පසු අදාල සෙසු අවශ්‍යතාවන් ද සම්පූර්ණ කර ඇති සේවකයන් ද පත් දින සිට වසර 06ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 11 ශ්‍රේණියට උසස් කි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. අභියෝගතා පරීක්ෂණයෙහි විෂය නිර් ඇමුණුම IV යටතේ දැක්වේ.

Scanned with CamScanner

සටහන :

I. සුවිශේෂී කාර්යය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබා ගත යුතුය. තවද, සුවිශේෂී කාර්යය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලැබේ. එක් නිලධරයෙකුට මෙම පරීක්ෂණයට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.

II. නිලධරයෙකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්යය සාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයෙකු සුවිශේෂී කාර්යය සාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සැලකෙනුයේ එම විභාගය සමත් වූ දිනය වේ.

10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. උසස් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ශ්‍රේණියේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.
II. පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
III. අනුමත කාර්ය සාධන අගැයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධාරියා විසින් නියමිත ආකෘතිය අනුව, ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව II ශ්‍රේණියට උසස් වී වසර දහය (10)ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින්ම සිදු කරනු ලැබේ.

10.2.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව

10.2.2.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට නිලධර ශ්‍රේණියේ II ශ්‍රේණියේ වසර නවයක (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක නවය (09)ම උපයාගෙන තිබීම.
II. අනුමත කාර්ය සාධන අගැයීමේ පරිපාටිය අනුව පූර්වාසන්න වසර නවය (09) තුල සුවිශේෂී කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
III. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

Scanned with CamScanner

10.2.2.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් සඳහා පත්කිරීම් බලධරයා විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50%ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා නිලධරයන් II ශ්‍රේණියට උසස් වී වසර (09)ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. ලකුණු ලබන ක්‍රමවේදය ඇමුණුම V මඟින් දැක්වේ.

10.3 I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම. : අදාල නොවේ.

සංලක්ෂය: (සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම් සඳහා වන පරීක්ෂණ වලට පෙනී සිටීම)

සුවිශේෂී කාර්යසාධනය ඇගයීමේ ක්‍රම වේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වා... වාර්ෂික කාර්යසාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබ අද... තැනැත්තන්ට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම් සඳහා වන ලිඛිත අභියෝගතා පරීක්ෂණය/ ව්‍යුහග... සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

11. තනතුරු වලට පත් කිරීම. - අදාල නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්න... නිරූපණ : "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන් රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

12.1 කාර්යයන් පැවරීම : පත්කිරීම් බලධරයා විසින්.

13. සේවයේ යෙදී සිටින නිලධාරීන් නව ශ්‍රේණි ක්‍රමය සඳහා අන්තර්ග්‍රහණය කරන ක්‍රමවේදය ඇමුණුම ' මඟින් දැක්වේ.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.02 දිනැති... විශේෂ ගැසට්පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි හා ආය... සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

15. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් ර... සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ :- 25/06/2012

අත්සන: ....

(විෂය භාර සහකාර මාණ්ඩලික නිලධරයා)

නම :

තනතුර : පී. එස්. සේනානි සෙනෙවිරත්න

සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ : 25/06/2012

අත්සන..

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න

තනතුර : අධ්‍යක්ෂ (පාලන) රා.ඉ.

දිනය : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

මාලිගාවත්ත,

නිර්දේශ කර ඉදිරිපත් කරමි. කොළඹ 10.

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :-

හිමල් හෙට්ටිආරච්චි

තනතුර :- අධ්‍යක්ෂ ජනරාල්

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

මාලිගාවත්ත,

නිල මුද්‍රාව :- කොළඹ 10.

දිනය :

Scanned with CamScanner

යොමු අංකය : 1/5/1/7/ධී.දෙ/ම.ප./MN1

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ 2 නිලධර ගණය සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ....

නම : ආචාර්ය දමිතා ද සොයිසා

ලේකම්,

ධීවර ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

දිනය : 2012.06.08

නිල මුද්‍රාව : ....ආචාර්ය.දමිතා ද සොයිසා
ලේකම්
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නව මහලේකම් කාර්යාලය
මාලිගාවත්ත, කොළඹ - 10.

යොමු අංකය : PSC/EST/3/1/36/2012

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන ඛණ්ඩ 2 සඳහා වන

මෙම බඳවා ගැනීමේ පටිපාටිය ...2012 - 05 - 22..... දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමතකරන ලදී.

අත්සන : [signature]

නම : ....

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය :- 2012.06.22

නිල මුද්‍රාව :- ....

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

Scanned with CamScanner

විභාග/පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ/පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ 2 නිලධර ගණය සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය/පරීක්ෂණය පිළිබඳ විස්තර :

තනතුර	ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකු
ධීවර බලපත්‍ර නිලධාරී	1. ආයතන කාර්යය පටිපාටිය	පැය 02	100	40%
	2. පොදු ප්‍රශ්න පත්‍රය	පැය 1 1/2	100	
ධීවර පරීක්ෂක සහ ධීවර සමාජ සංවර්ධන සහකාර	1. ආයතන කටයුතු හා මුදල් රෙගුලාසි	පැය 1 1/2	100	
	2. ධීවර පනත හා රෙගුලාසි	පැය 1 1/2	100	

03. පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

තනතුර	ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
ධීවර බලපත්‍ර නිලධාරී	ආයතන කාර්යය පටිපාටිය	කාර්යය පටිපාටික රීති
	පොදු ප්‍රශ්න පත්‍රය	ආයතනයේ කාර්යභාරය හා විෂයය පිළිබඳ දැනුම පරීක්ෂා කි
ධීවර පරීක්ෂක සහ ධීවර සමාජ සංවර්ධන සහකාර	ආයතන කටයුතු හා මුදල් රෙගුලාසි	රජයේ කාර්යාලවල භාවිතා වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා ඒ ප්‍රායෝගිකව භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ. ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද ආවරණය කරමින් ස කළමනාකරණයේදී වැදගත් වන ආයතන කටයුතු පිළිබඳව අවබෝධයක් ලබා හැකිවන පරිදි ආයතන සංග්‍රහයේ I කාණ්ඩය ඇසුරින් සකස් කරනු ලැබේ. ආයතන සංග්‍රහය I වන පරිච්ඡේදය :සාමාන්‍ය II වන පරිච්ඡේදය :සේවයට බඳවා ගැනීමේ කාර්ය පටිපාටි හා පත්කිරී IV වන පරිච්ඡේදය :මස් පඩි,කාලානුරූප තත්ත්වය, ජීවන තත්ත්වය,ස විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම V වන පරිච්ඡේදය : මුදාහැරීම, කලින් දැරූ තනතුරට පෙරළා යැවීම ස සේවය අවසන් කිරීම. VII වන පරිච්ඡේදය : වැටුප් IX වන පරිච්ඡේදය :ගාස්තු XXVII වන පරිච්ඡේදය :ලිපි ගනුදෙනු කිරීමේ ක්‍රමය XXXI වන පරිච්ඡේදය- :සමිති සමාගම් පවත්වාගෙන යාමේ සහ අදහස් ප්‍ර කිරීමේ අයිතිවාසිකම් ඇත්ති විඳීම XXXII වන පරිච්ඡේදය :දේශපාලන අයිතිවාසිකම් ඇත්ති විඳීම XLVII වන පරිච්ඡේදය :සාමාන්‍ය හැසිරීම හා විනය XLVIII වන පරිච්ඡේදය :විනය කාර්ය පටිපාටිය පිළිබඳ රීති

Scanned with CamScanner

		රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහය III වන පරිච්ඡේදය : පත් කිරීම IV වන පරිච්ඡේදය : සේවා [illegible] VI වන පරිච්ඡේදය : [illegible] VIII වන පරිච්ඡේදය : කාර්යාල කාලය, [illegible] කිරීම XII වන පරිච්ඡේදය : රජයේ නිලධාරීන්ගෙ රජයේ සේවයෙන් [illegible] හෝ [illegible] මුදා හැරීම XVI වන පරිච්ඡේදය : සේවය දීර්ඝ කිරීම හා විශ්‍රාම ගැන්වීම රජයේ කාර්යාලවල භාවිතා වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යයන් පිළිබඳ අවබෝධය හා දැනුම තිබීම අපේක්ෂා කෙරේ. මේ සඳහා මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද අදාළ වේ. මුදල් රෙගුලාසි සංග්‍රහයේ I වන කාණ්ඩයේ I සිට IX දක්වා
	ධීවර පනත හා රෙගුලාසි	1. (අ) ධීවර හා ජලජ සම්පත් පනතේ විධිවිධාන සම්බන්ධ මූලික දැනුම (ආ). ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර දීම පිළිබඳ සම්බන්ධ මූලික දැනුම (ඇ). මසුන් සහ වෙනත් ජලජ සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳ විධිවිධාන සම්බන්ධ මූලික දැනුම 11. වරින් වර පනවා ඇති ධීවර නියෝග සම්බන්ධ මූලික දැනුම 111. ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සම්බන්ධ මූලික දැනුම

සකස් කළේ :- 05/06/2012

අත්සන: ....

නම: යූ. වී. එස්. සේනානි සෙනෙවිරත්න
සහකාර අධ්‍යක්ෂ (පාලන)

තනතුර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය : අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ :-

අත්සන: .... /06/2012

එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න
අධ්‍යක්ෂ (පාලන) රා.ශ්‍රී.
තනතුර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත,
දිනය : කොළඹ 10.

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- නිමල් හෙට්ටිආරච්චි

තනතුර :- අධ්‍යක්ෂ ජනරාල්

දිනය :- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත,

නිල මුද්‍රාව :- කොළඹ 10.

Scanned with CamScanner

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ/පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ 2 නිලධර ශ්‍රේණිය සඳහා වූ 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය/පරීක්ෂණය පිළිබඳ විස්තර :

තනතුර	ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
ධීවර බලපත්‍ර නිලධාරී	1. ආයතන සංග්‍රහය	පැය 02	100	40%
	2. මුදල් රෙගුලාසි	පැය 02	100	
	3. පරිගණක හැකියාව	පැය 1 1/2	100	
ධීවර පරීක්ෂක සහ ධීවර සමාජ සංවර්ධන සහකාර	1. 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත පිළිබඳ ප්‍රශ්න පත්‍රය	පැය 02	100	
	2. දෙපාර්තමේන්තු නියෝග, චක්‍රලේඛ හා උපදෙස් ප්‍රශ්න පත්‍රය	පැය 02	100	
	3. ව්‍යාපෘතිකරණය	පැය 02	100	

03. පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබ ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

තනතුර	ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
ධීවර බලපත්‍ර නිලධාරී	ආයතන සංග්‍රහය	ආයතන සංග්‍රහයේ VII සිට XLVIII දක්වා පරිච්ඡේද පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ පරිච්ඡේද III, IV, VI, VII, XII, XVI පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.
	මුදල් රෙගුලාසි	මුදල් රෙගුලාසිවල 1 වන කණ්ඩයේ 1 සිට V දක්වා පරිච්ඡේද පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.
	පරිගණක හැකියාව	වදන් සැකසුම, පැතුරුම්පත්, දත්ත සමුදාය, ඉදිරිපත් කිරීම/චිත්‍ර සටහන්, අන්තර්ජාලය, විද්‍යුත් තැපැල, ඊ-මේල් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

Scanned with CamScanner

ධීවර පරීක්ෂක සහ ධීවර සමාජ සංවර්ධන සහකාර	1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත පිළිබඳ ප්‍රශ්න පත්‍රය	I. 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත II. ධීවර හා ජලජ සම්පත් පනත යටතේ පනවා ඇති නියෝග හා පනතින් පරිච්ඡින්න නොකරන ලද නියෝග. III. ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය IV. ධීවර සංවිධාන මූලධර්ම සහ ප්‍රතිපත්ති V. උසාවි කාර්ය පරිපාටිය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම
	දෙපාර්තමේන්තු නියෝග, චක්‍රලේඛ හා උපදෙස් ප්‍රශ්න පත්‍රය	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් වරින් වර නිකුත් කර ඇති සියළුම වලංගු නියෝග චක්‍රලේඛ හා උපදෙස් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම
	ව්‍යාපෘතිකරණය	රාජ්‍ය සේවා පුහුණු ආයතනයේ පවත්වනු ලබන ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පාඨමාලාව හදාරා එම පාඨමාලාව තුළ අන්තර්ගත පහත සඳහන් මාතෘකා යටතේ දැනුම පරීක්ෂා කිරීම I. ව්‍යාපෘතිය හඳුනා ගැනීම සහ ව්‍යාපෘති චක්‍ර II. ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාගැනීම සහ අරමුදල් සපයා ගැනීම III. ව්‍යාපෘතිවලශක්‍යතා අධ්‍යයනය (ප්‍රායෝගික අභ්‍යාස සහිතව) IV. ව්‍යාපෘති වාර්තා , වැඩ සැලැස්ම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම V. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම, ඇගයීම VI. ව්‍යාපෘති හා සම්බන්ධිත ප්‍රසම්පාදන ක්‍රියා විධිය

සකස් කළේ 05/06/2012
අත්සන: ....
නම: වී. එස්. සේනානි සෙනෙවිරත්.
තනතුර : සහකාර අධ්‍යක්ෂ (පාලන)
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
දිනය : අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ :- 05/06/2012
අත්සන: ....
නම එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න
තනතුර : අධ්‍යක්ෂ (පාලන) රා.ඉ.
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
දිනය : මාලිගාවත්ත,
කොළඹ 10.

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම :-
නිමල් හෙට්ටිආරච්චි
තනතුර :- අධ්‍යක්ෂ ජනරාල්
දිනය :- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
නිල මුද්‍රාව :- මාලිගාවත්ත,
කොළඹ 10.

Scanned with CamScanner

<u>විභාග/පරීක්ෂණ පිළිබඳ විස්තර</u>

01. විභාගයේ/පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ 2 නිලධර ගණය සඳහා වන 3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

02. විභාගය/පරීක්ෂණය පිළිබඳ විස්තර :

තනතුර	ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	[illegible]
ධීවර බලපත්‍ර නිලධාරී	1. පොදු ප්‍රශ්න පත්‍රය	පැය 02	100	
ධීවර පරීක්ෂක සහ ධීවර සමාජ සංවර්ධන සහකාර	1. උසාවි කාර්ය පටිපාටිය	පැය 02	100	40
	2. ධීවර සංවිධාන ප්‍රතිපත්ති	පැය 02	100	
	3. දෙපාර්තමේන්තු නියෝග	පැය 02	100	

03. පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය :

තනතුර	ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
ධීවර බලපත්‍ර නිලධාරී	පොදු ප්‍රශ්න පත්‍රය	මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකින් යුක්ත වේ. I. කිසියම් ප්‍රකාශයක් හෝ සාකච්ඡාවක සටහනක් කියා අර්ථ කොටගෙන ලිපියක් හා/හෝ වාර්තාවක් පිළියෙල කිරීම. II. කාලීන සමාජයීය සිදුවීම් පිළිබඳව අවබෝධ කොටගෙන විග්‍ර[illegible] දැක්වීම පිළිබඳ හැකියාව මැනීම.
ධීවර පරීක්ෂක සහ ධීවර සමාජ සංවර්ධන සහකාර	උසාවි කාර්ය පටිපාටිය	I. ධීවර හා ජලජ සම්පත් පනතේ V11 වන කොටස - බලයලත් නිලධරයන් සහ ඔවුන්ගේ බලතල සම්බන්ධ දැනුම II. IX වන කොටස - වැරදි සහ දණ්ඩන සම්බන්ධ දැනුම III. X වන කොටස- සම්බන්ධ දැනුම IV. උසාවි කාර්ය පරිපාටිය පිළිබඳ දැනුම V. අධිකරණ බල ප්‍රදේශය VI. අධිකරණය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කලයුතු ආකාරය සහ සමග ඉදිරිපත් කල යුතු ලේඛණ VII. වරෙන්තු පිළිබඳ පිළිවෙත VIII. සාක්ෂි ආඥා පනත පිළිබඳ දැනුම IX. ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක පරිසර නීතිය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

Scanned with CamScanner

	ධීවර සංවිධාන ප්‍රතිපත්ති	I. ධීවර සංවිධාන මූලධර්ම සහ ප්‍රතිපත්ති II. ලංකාවේ ධීවර සංවිධාන පිහිටුවීමේ මූලික පරමාර්ථ III. ලංකාවේ ධීවර සංවිධාන සමිති ඉතිහාසය IV. ධීවර සංවිධාන සමිති වල ක්‍රියාකාරීත්වය, බල ප්‍රදේශය හා සාමාජිකත්වය V. ධීවර සංවිධාන සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, බලතල හා වගකීම් VI. ධීවර සංවිධාන සමිති ව්‍යවස්ථාව VII. ධීවර සංවිධාන නීතිය / අණුවම්, සමුපකාර සමිති පනතේ රීති මාලාව VIII. ධීවර සංවිධාන වත්කම් හා වගකීම් IX. ධීවර සංවිධානයක කාරක නියෝග X. ධීවර අමාත්‍යාංශය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ධීවර සංවිධානයට සම්බන්ධ වන අයුරු XI. ශ්‍රී ලංකා ධීවර මහා සම්මේලනය XII. ධීවර සංවිධාන කටයුතු පිළිබඳ ධීවර පරීක්ෂකවරයකුගේ කාර්ය භාරය XIII. ධීවර සංවිධාන සමිතියක ගිණුම් ක්‍රම XIV. ධීවර සංවිධාන වලට මූල්‍ය ආයතන වලින් ණය ලබා ගත හැකි ක්‍රම සහ ධීවර සංවිධාන සඳහා ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.
	දෙපාර්තමේන්තු නියෝග	I. 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත යටතේ පනවා ඇති නියෝග II. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් වරින් වර නිකුත් කර ඇති සියළුම වලංගු නියෝග චක්‍රලේඛ හා උපදෙස් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.

සකස් කළේ : 05/06/2012

අත්සන: ....

නම : යූ. වී. එස්. සේනානි සෙනෙවිරත්න

තනතුර : සහකාර අධ්‍යක්ෂ (පා.ල.නා)

දිනය : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ : 05/06/2012

අත්සන: ....

නම : එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න

තනතුර : අධ්‍යක්ෂ (පාලන) රා.ම.

දිනය : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මාලිගාවත්ත, කොළඹ 10.

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :-

තනතුර :-

දිනය :

නිල මුද්‍රාව :-

නිමල් හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත,
කොළඹ 10.

Scanned with CamScanner

විභාග පිළිබඳ ආකෘතිය

01. විභාගයේ/පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන - ඛණ්ඩ 2 නිලධර ගණය සඳහා වූ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට සුවිශේෂී කාර්යය සාධනය යටතේ උසස්වීම් සඳහා වන විභාගය

02. විභාගය/පරීක්ෂණය පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
අභියෝගතා පරීක්ෂණය	පැය 02	100	60%

03. විභාගය පවත්වනු ලබන බලධරයා : ධීවර ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක් වරක් පවත්වන අතර නිලධරයෙකුට පෙනී සිටිය හැක්කේ ද එක් වරක් පමණි.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
අභියෝගතා පරීක්ෂණය	තමා වෙත පැවරෙන සියලු කාර්යයන් සාමාන්‍ය කාර්යක්ෂමතා මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටු කිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප මෙන්ම අපේක්ෂිත ප්‍රවීණතාවන් අත්පත් කර ගෙන තිබේද යන්න මැන බැලීමේ [illegible] අභියෝගතා පරීක්ෂණයකි.

සකස් කළේ : 05/06/2012
අත්සන : ....
නම: ඩී. වී. එස්. සේනානි ෆොන්සේකා
තනතුර: සහකාර අධ්‍යක්ෂ (පාලන)
දිනය: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ :
අත්සන : ....
නම එච්. එම්. කේ. ජේ. බී. [illegible]
තනතුර: අධ්‍යක්ෂ (පාලන) රා.ගු.
දිනය: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත,
කොළඹ 10.

අත්සන : ....
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : නිමල් හෙට්ටිආරච්චි
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත,
කොළඹ 10.
නිල මුද්‍රාව :

Scanned with CamScanner

<u>ඇමුණුම V</u>

<u>II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන</u>
<u>විනුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීම</u>

පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
1. රාජකාරි කටයුතු වලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් (එක් දායකත්වයක් සඳහා ලකුණු 05 බැගින්)	50	
2. කාර්ය සාධනය ඇගයීම (උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා) ඉතා හොඳයි - ලකුණු 09 හොඳයි - ලකුණු 06 සතුටුදායකයි - ලකුණු 03	45	50%
3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය	05	
	100	

සකස් කළේ :

අත්සන : 05/06/2012

නම : යූ. වී. එස්. සේනානි සෙනෙවිරත්න

තනතුර: සහකාර අධ්‍යක්ෂ (පාලන)

දිනය: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට

පරීක්ෂා කළේ :

අත්සන : 05/06/2012

නම : එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න

තනතුර: අධ්‍යක්ෂ (පාලන) රා.ශු.

දිනය: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත,
කොළඹ 10.

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය :

නිල මුද්‍රාව :

නිමල් හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත,
කොළඹ 10.

Scanned with CamScanner

<u>සේවයේ යෙදී සිටින්නන් මෙම බඳවාගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම</u>

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (IV) මඟින් ලබා දී ඇති MN 1-2006 (ඒ) වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන ධීවර පරීක්ෂක,සමාජ සංවර්ධන සහකාර, යන නිලධාරීන් සියල්ලෝම නව බඳවාගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට පහත සඳහන් පරිදි ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට පත්කරන ලද දිනය පදනම් කරගෙනය. අන්තර්ග්‍රහණය මත වැටුප් පරිවර්තනය ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව සිදුකළ යුතුය.කෙසේ වෙතුදු, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල තැනැත්තාගේ වැටුප් වර්ධක දිනය වර්ධක දිනයෙහි කිසිදු වෙනසක් සිදුනොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකල යුතුය.

(i) MN 1 - III ශ්‍රේණිය

(අ) MN 1-2006 (ඒ) වැටුප් පරිමාණය යටතේ III ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ ද... නැති සේවකයින්.

(ආ) III ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙ... අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ වුවද II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම සඳ... අවශ්‍ය සෙසු සුදුසුකම් සපුරා නොමැති සේවකයින්.

MN 1 - III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) MN 1 - II ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 10කට නොඅඩු එහෙත් අවුරුදු 20කට අඩු සේවා කාල... සම්පූර්ණ කර ඇති එමෙන්ම අවම වශයෙන් අවුරුදු දහයක (10) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අදාල කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව බඳවා ගැනීම් පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා අපුරා ඇති සේවකයින්.

(ආ) MN 1-2006 (ඒ) වැටුප් පරිමාණයේ II ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 10 ක සේවා කාලයක් සම්පූර්ණ... නැති සේවකයින්.

(ඇ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණි... සේවා කාලය වසර 10 සම්පූර්ණ වුවද, ඉහත සඳහන් අනෙකුත් අවශ්‍යතා සපුරා නොමැති සේවකයින්.

MN 1 - II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

Scanned with CamScanner

(iii) MN 1 - I ශ්‍රේණිය

(අ) ඉහත සඳහන් පරිදි III ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් අවුරුදු 20ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති හා නව බඳවා ගැනීමේ පරිපාටි ක්‍රියාත්මක වීමට පෙර ක්‍රියාත්මකව පැවති බඳවා ගැනීමේ පරිපාටිය අනුව අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ආ) ඉහත සඳහන් පරිදි II ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක යටත් පිරිසෙයින් වසර 10 ක සේවා කාලයක් ඇති එමෙන්ම අදාල කාලය තුළ වැටුප් වර්ධක සියල්ල උපයාගෙන ඇති සහ ඉහත සඳහන් අනෙකුත් සේවා අවශ්‍යතා සපුරා ඇති සේවකයින්.

(ඇ) MN 1-2006 (ඒ) වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාල වැටුප් නියම කර ඇති තනතුරක හෝ ශ්‍රේණියක් යටතේ වැටුප් ලබන සේවකයින්.

MN 1 - I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සකස් කළේ:-
අත්සන : 05/06/2012
නම : යූ. ඩී. එස්. සේනානි සෙනෙවිරත්න
සහකාර අධ්‍යක්ෂ (පාලන)
තනතුර : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
දිනය :

පරීක්ෂා කළේ:-
අත්සන : 05/06/2012
නම : එච්. එම්. කේ. ජේ. බී. ගුණරත්න
අධ්‍යක්ෂ (පාලන) වා.වු.
තනතුර : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත,
කොළඹ 10.
දිනය :

අත්සන (දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : නිමල් හෙට්ටිආරච්චි
තනතුර : අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
දිනය : මාළිගාවත්ත,
කොළඹ 10.
නිල මුද්‍රාව:

Scanned with CamScanner

දුරකථන / தொலைபேசி / Telephones 011-2136600 011-2136650
ලේකම් / செயலாளர் / Secretary 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax 011-2876169 011-2876181
විද්‍යුත් තැපැල් / மின்னஞ்சல் / E-mail info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.psc.gov.lk

සංශෝධන අංක 01 R 5778

මගේ අංකය / My No. PSC/ESI/7/1/36/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No. MF/AD/7/1/...

දිනය / திகதி / Date 2022.06.29

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

07 JUL 2022

ලේකම්,

ධීවර අමාත්‍යාංශය.

<u>කළමනාකරණ සහකාර තාක්ෂණ මණ්ඩ 3 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම (MT 1 2006A)</u>

උක්ත කරුණ සම්බන්ධව ඔබගේ සමාංක හා 2022.01.07 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.08.14 දිනැතිව අනුමත කරන ලද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ මණ්ඩ 3 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සඳහා මේ සමඟ යොමු කරන ඇමුණුම 01 හි සඳහන් සංශෝධනයන් ඇතුළත් කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.06.21 දින අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීමේ පටිපාටියෙහි සටහන් කර තබන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ඩී.ඩබ්ලිව්. ගයාන්
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට.

පිටපත්:
1. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව - කාරු.දැ.ගැ.ස.
2. අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - කාරු.දැ.ගැ.ස.
3. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කාරු.දැ.ගැ.ස.

Scanned with CamScanner

සංශෝධන ලැයිස්තුව

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

කළමනාකරණ සහකාරතාක්ෂණ ඛණ්ඩ 3 නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01 වන සංශෝධනය

අනු අංකය	ඡේද අංකය	සංශෝධනය විය යුතු ආකාරය
1	1.3	දැනට මේ යටතේ සඳහන් කරුණු වලට අමතරව පහත සඳහන් යොමු අංකය හා දිනය ඇතුළත් කරනු ලැබේ. යොමු අංකය: DMS/1141/Vol II දිනය: 2015.01.01 යොමු අංකය:DMS/1141/Vol III දිනය:2016.08.30 යොමු අංකය: 1/4/1/7/ධී.දෙ./කාර්.ම.ප්‍රතිව්‍යුහ දිනය: 2018.04.11
2	1.4	දැනට මේ යටතේ සඳහන් කරුණු වලට අමතරව පහත සඳහන් යොමු අංකය හා දිනය ඇතුළත් කරනු ලැබේ යොමුඅංකය: EST-2/04/REC/10302 දිනය:2016.08.10
3	1.5	දැනට මේ යටතේ සඳහන් කරුණු වලට අමතරව පහත සඳහන් යොමු අංකය හා දිනය ඇතුළත් කරනු ලැබේ යොමු අංකය:NSCC/4/22/77/SR-IIIදිනය:2018.10.31
4	1.6	යොමු අංකය: PSC/EST/7/1/36/1/2012 දිනය:2012.08.14 පළමු සංශෝධිත දිනය :
	5.4	පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා මාසික දීමනාව: රු. 12,000
	6.1	අදාළ වගුවේ,පළමු තීරයේ, <u>ජ්‍යෙෂ්ඨ</u> ගුවන් විදුලි නිලධාරී" යන්න සංශෝධනය කරන්න. කණිෂ්ඨ ගුවන් විදුලි නිලධාරීන් සඳහා අනුමත නිලධර සංඛ්‍යාව 62 ලෙස සංශෝධනය කරන්න.
13	6.2	ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව: 68 ලෙස ඇතුළත් කිරීමට <u>ජ්‍යෙෂ්ඨ</u> ගුවන් විදුලි නිලධාරී ලෙස සංශෝධනය කිරීමට. කණිෂ්ඨ ගුවන් විදුලි නිලධාරීන් සංඛ්‍යාව 62 ලෙස සංශෝධනය කිරීමට.
14	7.2.1.1	බඳවා ගන්නා ශ්‍රේණිය: <u>පුහුණු ශ්‍රේණිය (මාස 6ක පුහුණු කාලයක් සඳහා)</u>
15	7.2.1.1.1	අධ්‍යාපන සුදුසුකම්: 1. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම. හා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා/ ගණිත/තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර

Scanned with CamScanner

<table>
<tr><td></td><td></td><td>සමත් වී තිබීම. පැරණි විෂයය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත් ව තිබීම ප්‍රමාණවත් වේ.</td></tr>
<tr><td>16</td><td>7.2.1.2.</td><td>III ශ්‍රේණිය</td></tr>
<tr><td>17</td><td>7.2.1.2.1</td><td>දැනට 7.2.2.1 යටතේ දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් 7.2.1.2.1 ලෙස ඇතුලත් කර අංකනය කරන්න</td></tr>
<tr><td>18</td><td>7.2.1.2.2</td><td>වෘත්තිය සුදුසුකම්: තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විදුලි සංදේශ හෝ ගුවන් විදුලි කටයුතු පිළිබඳ ජාතික වෘත්තිය කුසලතා (N.V.Q.) පහ (5) මට්ටමට ඇතුළත් වන්නා වූ පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම

හෝ

පුහුණු ශ්‍රේණියට බඳවා ගනු ලැබ එම කාලසීමාව තුළ දී ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සාගර විශ්වවිද්‍යාලය මගින් කණිෂ්ඨ ගුවන්විදුලි නිලධාරීන් සඳහා පවත්වනු ලබන මාස හයක (06) පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර සහතික පත්‍රය ලබා තිබීම.

සටහන - කණිෂ්ඨ ගුවන්විදුලි නිලධාරි පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ දී III ශ්‍රේණිය සඳහා 7.2.1.2.2 හි සඳහන් සුදුසුකම් සපුරා ඇති ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොසිටී නම් ඉතිරි ප්‍රමාණය පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.
පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගත් අයදුම්කරුවන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සාගර විශ්වවිද්‍යාලය මගින් කණිෂ්ඨ ගුවන්විදුලි නිලධාරීන් සඳහා පවත්වනු ලබන මාස හයක (06) පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා ගත් පසුව කණිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි III ශ්‍රේණියට පත් කරනු ලැබේ.</td></tr>
<tr><td>19</td><td>7.2.2</td><td>දැනට 7.2.2.4 යටතේ දක්වා ඇති සුදුසුකම් 7.2.2 ලෙස ඇතුලත් කර අංකනය කරන්න</td></tr>
<tr><td>20</td><td>7.2.3</td><td>දැනට 7.2.2.5 යටතේ දක්වා ඇති කරුණු 7.2.3 ලෙස ඇතුලත් කර අංකනය කරන්න</td></tr>
<tr><td>21</td><td>7.2.4</td><td>දැනට 7.2.3 යටතේ දක්වා ඇති කරුණු 7.2.4 ලෙස ඇතුලත් කර අංකනය කරන්න</td></tr>
<tr><td>22</td><td>7.2.5</td><td>බඳවා ගැනීමේ ක්‍රමය : විවෘත තරග විභාගයක් මගින් හා සම්මුඛ පරීක්ෂණයක් මගින්

7.2.5.1 ලිඛිත විභාගය:
7.2.5.1.1 : පුහුණු ශ්‍රේණිය සඳහා
<table><tr><th>විෂයයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr><tr><td>(1) බුද්ධි පරීක්ෂණය</td><td>100</td><td>40</td></tr><tr><td>(2) සාමාන්‍ය දැනුම</td><td>100</td><td>40</td></tr></table>විෂයය නිර්දේශය ඇමුණුම I හි දක්වා ඇත.

7.2.5.1.2 : III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා
<table><tr><th>විෂයයන්</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr><tr><td>(1) බුද්ධි පරීක්ෂණය</td><td>100</td><td>40</td></tr></table></td></tr>
</table>

Scanned with CamScanner

		(2) සාමාන්‍ය දැනුම — 100 — 40 (3) විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය — 100 — 40 විෂයය නිර්දේශය ඇමුණුම II හි දක්වා ඇත.
23	7.2.5.2	පවත්වන බලධරයා: ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්
24	7.2.5.3	වෘත්තීය පරීක්ෂණය: අදාළ නොවේ
25	7.2.4.2.1	පවත්වන බලධරයා: අදාළ නොවේ
26	7.2.5.4	ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ
27	7.2.4.3.1	පවත්වන බලධරයා: අදාළ නොවේ
28	7.2.5.5	සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: ලකුණු ලබා දෙනු නොලැබේ. ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු: හුදෙක් සුදුසුකම්, සහතික හා මනෝ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි.
29	7.2.5.5.1	පවත්වන බලධරයා: ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්
30	7.2.5.6	අයදුම්පත් කැඳවීමේ ක්‍රමය: රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මගින්
31	8.1	විෂය නිර්දේශ ඇමුණුම <u>III, IV, V</u> ලෙස ඇතුළත් කිරීමට
32	9.1	ලබා ගතයුතු ප්‍රවීණතාවය පේළියේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 07/2007 යන්න 18/2020 ලෙස සංශෝධනය කරන්න
33	10.1	10.1.1.1 IV - දැනට පවතින වගන්තිය ඉවත් කර ඒ වෙනුවට "රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම" ලෙස ඇතුළත් කරන්න
34	10.2	10.2.1.1 II - දැනට පවතින වගන්තිය ඉවත් කර ඒ වෙනුවට "රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම"ලෙස ඇතුළත් කරන්න
35	11.2	තෝරා ගනු ලබන ක්‍රමය: ඉහත 7.2.5.1.2 පරිදි ඉහළ ලකුණු ලබන අයදුම්කරුවන් අතුරින් පුරප්පාඩු ගණනට සමාන සංඛ්‍යාවක් Junior Radio Officer III (කණිෂ්ඨ ගුවන්විදුලි නිලධාරි III) තනතුර සඳහා තෝරා පත් කරනු ඇත. ඒ යටතේ සුදුසුකම් ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින්නේ නම් 7.2.5.1.1 අනුව ඉහළ ලකුණු ලබන අයදුම්කරුවන් අතරින් ඉතිරි පුරප්පාඩු ගණනට සමාන සංඛ්‍යාවක් පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. පුහුණුව සාර්ථකව නිම කර සහතික පත්‍ර ලබා ඇති අයදුම්කරුවන් කණිෂ්ඨ ගුවන්විදුලි නිලධාරි III තනතුර සඳහා තෝරා පත් කරනු ලැබේ.

Scanned with CamScanner

		සංලක්ෂය: 1. සේවා ගිවිසුම පිළිබඳ විස්තරය: පුහුණු කාලසීමාවට බඳවා ගෙන III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් III ශ්‍රේණියට පත්වීම ලද දින සිට වසර 10ක කාලයක් අනිවාර්යයෙන්ම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට සේවය කළ යුතුය. 2. එසේ වසර 10ක සේවයට පෙර ඉවත්ව නොයන බවටත්, ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් වගකීමකට බැඳිය යුතුය. 3. පුහුණුව අවසානයේදී ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර, සමත් වන පුහුණු ශ්‍රේණියට අයත් නිලධාරීන් III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වන්නාන්හට නැවත පැවැත්වෙන පුහුණුව අවසන් පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවස්ථා 02ක් ලබා දෙන අතර, ඉන් ද අසමත් වන අයගේ පුහුණු පත්වීම අවසන් කරනු ලැබේ.
36	13	ඇමුණුම VII යන්න ඇමුණුම VIII ලෙස සංශෝධනය කරන්න.
37	ඇමුණුම I	මෙම සංශෝධන ලැයිස්තුව සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම I අදාළ කර ගනු ලැබේ.
38	ඇමුණුම II	මෙම සංශෝධන ලැයිස්තුව සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම II අදාළ කර ගනු ලැබේ.
39		දැනට I සිට VI දක්වා ඇති ඇමුණුම III සිට VIII ලෙස සංශෝධනය කරන්න
40		පරිපාටිය ලෙස සඳහන් වන සියලුම ස්ථාන පටිපාටිය ලෙස සංශෝධනය කරන්න
41		සමස්ත උසස් කිරීමේ පටිපාටියේ අක්ෂර වින්‍යාසය පරීක්ෂා කර අඩුපාඩු/ වැරදි සහිත ස්ථාන නිවැරදි කරන්න.

28/06/2022

Scanned with CamScanner

ඇමුණුම I

විභාග/පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ/ පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 3 නිලධර ගණයේ

පුහුණු ශ්‍රේණිය සඳහා වන විවෘත බඳවා ගැනීමේ විභාගය

02. විභාගය/පරීක්ෂණ පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%
සාමාන්‍ය දැනුම	පැය 01	100	40%

03.විභාගය පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින්

04.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය අනුව වසරකට වරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

Scanned with CamScanner

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
බුද්ධි පරීක්ෂණය	සංඛ්‍යානමය හැකියාව, ගැටළු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද විෂයානුබද්ධ කෙටි ප්‍රශ්න පත්‍රයකි.
සාමාන්‍ය දැනුම	ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය , ආර්ථික, වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර, සබඳතා, කළමනාකරණ, විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසර, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හි වැදගත් සිද්ධීන් ද අදාලව විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුම මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

සකස් කළේ :

අත්සන : ....

නම :

තනතුර:

දිනය:

පරීක්ෂා කළේ :

අත්සන : ....

නම :

තනතුර:

දිනය:

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය :

නිල මුද්‍රාව :

Scanned with CamScanner

ඇමුණුම II

විභාග/පරීක්ෂණ පිළිබඳ විස්තර

01. විභාගයේ/ පරීක්ෂණයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 3 නිලධර ගණයේ

III ශ්‍රේණිය සඳහා වන විවෘත බඳවා ගැනීමේ විභාගය

02. විභාගය/පරීක්ෂණ පිළිබඳ විස්තර :

ප්‍රශ්න පත්‍රය	කාලය	මුළු ලකුණු ප්‍රමාණය	සමත් ලකුණු ප්‍රමාණය
බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%
සාමාන්‍ය දැනුම	පැය 01	100	40%
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	පැය 01 1/4	100	40%

03.විභාගය පවත්වනු ලබන බලධරයා : ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල් හෝ ඔහු විසින්

බලය

පවරනු ලබන ආයතනයක් විසින්

04.විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාවය අනුව වසරකට එක්වරක්

ආනාගුලි
29/06/2022

Scanned with CamScanner

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
බුද්ධි පරීක්ෂණය	සංඛ්‍යානමය හැකියාව, ගැටළු නිරාකරණය,තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද විෂයානුබද්ධ කෙටි ප්‍රශ්න පත්‍රයකි.
සාමාන්‍ය දැනුම	ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය , ආර්ථික,වාණිජ,දේශපාලන,ජාත්‍යන්තර, සබඳතා,කළමනාකරණ,විද්‍යා හා තාක්ෂණවඅධ්‍යාපන,සෞඛ්‍ය,ක්‍රීඩා,පරිසර,සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයනිහි වැදගත් සිද්ධීන් ද අදාලව විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුම මැන බැලීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න කිහිපයකට පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.
විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	.රිසීවරය- A.M,F.M,N.M,SSB,CWඅධිහෙටිරොඩයින් (Superhetrodyne) කාර්යයන් හා පාලක 2.සම්ප්‍රේෂක-CW,AM,FM විකාශන සංඥා භාර ගැනීම, මෝස් සංඥා යැවීම, ඛලධාරික සකස් කිරීමේ අදියර, SWR-SWR මීටර් භාවිතයේ වැදගත්කම, හාමොනික් හා ව්‍යාජ විකිරණ. 3.සම්ප්‍රේෂණ මාර්ග සහ සටහන් අනුනය කරන හා සාමාන්තර කල මාර්ග බාධක 4.අන්තන සිරස්, ද්විත්ව, යාගි අන්තන, අන්තන වාසිය, උසෙහි බලපෑම, ධ්‍රැවීකරණය. 5.තරංග ව්‍යාප්තිය අයනීකරණය, අයන ගෝලයේ ස්ථර, සූර්යය ලප , MUF, LUF, OTF අවධි සංඛ්‍යානය, පැනුම් දුර ප්‍රමාණය, පැනුම් කලාපය, විලදායි උස, අහස් තරංග , සෘජු තරංග හීන කිරීම.

Scanned with CamScanner

	6.පණිවුඩ හුවමාරු කිරීමේ මූලිකාංග සයින් තරංග, තරංග කාලය,සංඛ්‍යාතය, ස්පීකරය, මයික්‍රෆෝනය, පරිමාණමිකය, විවිධ ප්‍රතිග්‍රහණය, ඩෙසිබෙල්, බැටරි අභ්‍යන්තර ප්‍රතිරෝධය, ධාරිතා බලය හා ආනයිතය. **7.මිනුම් උපකරණ** VOM තාප විද්‍යුත් යුගම මීටර, කපාට වෝල්ට් මීටරය, අවපාතික මීටරය, SWR මීටරය RF වෝල්ට් මීටරය, මෙගර් **8.පරිපථ හා ඇමුණුම් උපකරණ** ට්‍රාන්සිස්ටර් ක්‍රියා කරවීමේ මූලධර්ම, ට්‍රාන්සිස්ටර් ක්ෂේත්‍රඵලය, ලෝහ ඔක්සයිඩ් අර්ධවාහක ට්‍රාන්සිස්ටර්, කපාට AF හා RF විකාශන යන්ත්‍රවල සරල පරිපථ ඇතුළුව මූලික පරිපථ කාර්යයන්, දෝලකය, මිශ්‍රකය, දෝෂකය, බල සැපයුම් සංඛ්‍යාත ගොනු කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.

සකස් කළේ :

අත්සන : ....

නම :

තනතුර:

දිනය:

පරීක්ෂා කළේ :

අත්සන : ....

නම :

තනතුර:

දිනය:

අත්සන : ....

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය :

නිල මුද්‍රාව :

Scanned with CamScanner